## ක්‍රිස්තියානි ආදරය ඔස්සේ වැලන්ටයින් හඳුනා ගනිමු[1]

**සංක්ෂිප්තය:**

ආදරය සහ ආශාව අතර දයලෙක්තිකය පැහැදිලි කර ගැනීම ඔස්සේ ධනවාදයේ ඓන්ද්‍රීය ගතිකය සහ ආශාව එකට බැඳී ඇති අයුරු ක්‍රිස්තියානි ආදරය පසුබිම් කරගෙන තේරුම් ගැනීම කෙසේ කළ හැකිද යන්න මෙම ලිපිය ඔස්සේ පැහැදිලි කෙරේ. ලිංගිකත්වය සහ ආදරය අතර පරස්පරතාව වටහා ගැනීම ඔස්සේ ධනවාදයට එරෙහි අරගලය නව ආකාරයකින් තේරුම් ගැනීම සඳහා මිනිස් 'ආශා පුහුණුව' සම්බන්ධ විසිවන සියවසේ ෆුකෝ ගේ කතිකාව ටොඩ් මැක්ගොවන් හරහා නැවත අර්ථකථනය කෙරේ. මෙම තත්ත්වය නව සන්දර්භයක් ඔස්සේ වැලන්ටයින් දිනය, මනුෂ්‍ය ආදරය, ආශාව සහ එහි පාරිභෝගිකකරණය (commodification) අර්ථකථනය කිරීම සඳහා ද මෙහිදී භාවිතා කිරීමට උත්සාහ කෙරේ.

### ක්‍රිස්තියානිය සහ ආදරය

සියලු ආගම්වල කාර්යභාරය සමාජය වෙත සදාචාරය (ආචාර ධර්මය) රැගෙන ඒම නම් (කාන්ට්ගේ ස්ථාවරය) එහි දී සියලු ආගම් අතුරින් ක්‍රිස්තියානියට සුවිශේෂී ස්ථානයක් හිමිවන බව සඳහන් කරන තරුණ හෙගල් එයට හේතුව ලෙස හඳුන්වන්නේ 'ක්‍රිස්ත්‍රියානිය සදාචාර නීතිය (moral law) වෙනුවට ආදරය (love) විතැන් කරගත් ලොව ප්‍රථම සහ එකම ආගම ලෙස' නිර්වචනය කර ගනිමින් සදාචාර නීතිය මත එල්බ නොගන්නා ක්‍රිස්තියානිය අනේකත්වය සහ අනෙකා හරහා කරන ආදරය කෙරේ විශ්වාසය තබයි. යම්කිසි ආගමක 'සත්‍යය' රඳා පවතින්නේ එම ආගම දේශනාකරන මූලධර්ම හෝ අභිචාර හෝ ප්‍රායෝගික ක්‍රියාකාරකම් (practices) මත නොව, එය මනුෂ්‍ය සදාචාරය (human morality) කෙරෙහි කොතරම් බලපෑම් සහගත ද යන්න මත ව පෙන්වා දෙන හෙගල් අන් සියලු ආගම් මෙන් ම ක්‍රිස්තියානිය ද එකම තිරස් තලයක ස්ථානගත කරයි. මෙම සෑම ආගමක් ම සංස්ථාගතවන වීමට (institutionalize) ගමන් කරනා අවස්ථාවේ දී එම සෑම ආගමක් විසින් ම 'මිනිස් නිදහස' පාවා දෙන බව සඳහන් කරන හෙගල් එතැන දී ආගම සදාචාරය වෙනුවට සංස්ථාපිත අධිකාරිත්වයක් (හෙජමොනික බව) තෝරා ගන්නා බව හඳුනා ගනී.

මෙයට හේතුව නම් සදාචාරය සහ නිදහස අතර ඇති සට්ඨනය හෙවත් පරස්පරාත්මක බව ලෙස හඳුනා ගන්නා හේගල් ආගම මෙහිදී ඇද වැටෙන්නේ 'ප්‍රාතිහාර්යය' වෙතට බවත් අධිපති මතවාද මෙන් ම ආගමික පෞරුෂ ද මෙහි දී ආගම ට බෙහෙවින් වැදගත් වන ආකාරය ද නිරීක්ෂණය කරයි. නිදහස් සදාචාර පුද්ගලත්ව ලෙස මිනිසාට නිදහස ලබා දීමට මෙතැන දී අපොහොසත් වන ආගම ඒ වෙනුවට, නිදහසේ අල්ලසක් ලෙස ප්‍රාතිහාර්ය වෙත මිනිස් ආත්මය යොමු කරයි. මෙහි දී ආගම් නැවත යොමු වන්නේ ඉන්ද්‍රිය අනුභූති ඥාණය (යථානුභූතවාදය- positivism) වෙතට බව පැහැදිලි අතර එවිට ආගමේ කේන්ද්‍රීය හරය වනු ලබන්නේ ආගමික සදාචාර නීතිරීති සහ දරදඬු අභිචාර විසින් ය. යුදෙව් ආගමේ මෙම ප්‍රායෝගික යථානුභූතික සන්දර්භයෙන් තීරණාත්මක ලෙස යේසුස් වහන්සේ ඛණ්ඩනය වන අතර එහි දී එතුමන් ප්‍රතිචාරයක් ලෙස පැවැති දරදඬු නීතිරීතිවලින් පසුබැසීම (retreat) පමණක් කරයි. ටොඩ් මැක්ගොවන් දක්වන ආකාරයට යේසුස් වහන්සේ හට නව ආගමක් නිර්මාණය කිරීමට කිසිසේත් අවශ්‍ය වුවේ නැත. එතුමන්ට අවශ්‍ය වුවේ පැවති නෛතික සදාචාරයෙන් මිනිසා නිදහස් කිරීම (liberate) පමණි. මේ අනුව ඔහු නව ආගමක් රැගෙන ආ දේව දූතයෙක් වනු වෙනුවට පැවති නෛතික ඒකාධිකාරය අභියෝගයට ලක් කළ

---

[1] *ජයසිරි අලවත්ත ගේ 'අරුමැසි ම කවි' **(2017)** ග්‍රන්ථය විමසුම් දිනය නිමිත්තෙන් පැවැත්වූ වැලන්ටයින් දින දේශනයේ පිටපත.* ***©** විසි එක්වන සියවසේ සමාජවාදය නැවත අර්ථකතනය කරගැනීමේ ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂයේ දේශපාලන අංශයේ වැඩපිළිවෙලක කොටසක් ලෙස සමාජගතවන මෙම ලියවිල්ලේ සියලු හිමිකම් ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂය සතුය.*

ප්‍රතිසංස්කරණවාදියෙක් විය. එනයින් ක්‍රිස්තියානිය කිසිදු නව මූලධර්මයක් හඳුන්වා නොදුන් බව මැක්ගොවන් සඳහන් කරයි (ඔහුගේ Can Philosophy Love? කෘතියේ 10 වන පිටුව බලන්න).

නමුත් හෙගල්ට අනුව යේසුස් වහන්සේ විසින් 'ගලවාගත්' ක්‍රිස්තියානිය අධිපති ආයතන ගත ක්‍රිස්තියානිය විසින් නැවතත් යුදෙව් බන්ධනයට හසු කරනු ලබන බව සහ එහි සීමා නීති රීතිවල ආධිපත්‍යයට නතුකරන බව පෙන්වා දෙයි. එහි දී වන්නේ ආයතන නීති රීති සහ අභිචාර විධි අර්චනකරණය කිරීමයි (fetishization). නිදහස සහ ස්වජන්දතාව (freewill) වෙනුවට 'උත්කෘෂ්ට' බවට පත්වන්නේ යම් යම් වන්දනීය - ශුද්ධවාදී අභිචාර ය. ක්‍රිස්තියානි ආයතනවල සිවිල් අධිකාරිමය බව ස්ථාපනය කරනවාට අමතරව මෙම අර්චනකරණයේ අනෙක් අරමුණ වූයේ මරණින් පසුව මිනිස් ආත්මය අත්පත් කර ගන්නා දෙවියන්ගේ රාජධානියයි (පිටුව 10). මේ අනුව මිනිස් නිදහස පිළිබඳ යේසුස් වහන්සේගේ මූලික අභිනය නම් විමුක්ති මූලය පාවාදෙන සමකාලීන ක්‍රිස්තියානිය තවත් එවැනිම විමුක්ති අභිනයකින් සුවපත් වීමක් ඉල්ලා සිටී. සදාචාරයට කරන ගෙවීමක් ලෙස නිදහස ලබා දීම ක්‍රිස්තියානියේ පොරොන්දුව වුව ද ඇත්ත වශයෙන් සිදුව ඇත්තේ නො-නිදහසක් නැවත ස්ථාපිත කිරීම බව මැක්ගොවන් පෙන්වා දෙයි. වෙනත් වචනයකින් කියන්නේ නම් නිදහස කැප කිරීම වෙනුවෙන් ගෙවන වන්දිය දෙවියන්ගේ රාජධානිය සම්මුඛ වීම ලෙස යේසුස් වහන්සේගේ අභිනය ප්‍රතිසූත්‍රගත කිරීමක් සමකාලීන ක්‍රිස්තියානිය තුළින් මේ අනුව සිදුව ඇත. **'සදාකාලික ස්වර්ගයේ ප්‍රීතිය සහ ආශිර්වාදය වෙනුවෙන් මිනිසාට සිවිල් සහ දේශපාලන නිදහස ලබා දීම ක්‍රිස්තියානි පල්ලිය විසින් පාවාදී ඇත'** යනුවෙන් හෙගල් සඳහන් කරන බව මැක්ගොවන් මෙහි දී දක්වා සිටී. චින්තනයේ නිදහස සහ හේතුවේ අධිකාරය මියගිය තැනක භෞතික ආශාව තෘප්තිමත් කිරීම හරියට මියගිය ශරීරයක් ආහාර සහ වතුර වෙනුවෙන් ආශා කිරීමට හෙගල් ඉහත තත්වය සමපාත කරයි. හේගල් මෙසේ කියයි;

> **''සදාචාරය හැරපියා සදාකාලික ස්වර්ගය දේශනා කරන ක්‍රිස්තියානිය මේ අනුව මිනිස් නිදහසේ සතුරෙකි. නො-නිදහස් ඒජන්තයෙකි.''**

## විෂය සහ වස්තුව අතර සම්බන්ධය

ආශා කරන්නා සහ ආශා කරන වස්තුව අතර සම්බන්ධය හඳුනා ගැනීම මිනිස් සම්බන්ධයක දී ඉතාම වැදගත් ය. මන්ද අද්‍යතන මිනිස් සම්බන්දතාවල පදනම බවට පත්ව ඇත්තේ ආශා කිරීම සහ ලිංගිකත්වය නිසා සහ ධනවාදය වනාහී ආශාව කුළු ගැන්වීම පදනම් කර ගනිමින් ක්‍රියාත්මක වන ආශා යාන්ත්‍රණයක් වන නිසා ය. මිෂෙල් ෆුකෝට අනුව ලිංගිකත්වය සහ ආශාව සම්බන්ධයෙන් වන ග්‍රස්තිකත්වය බල යාන්ත්‍රණයක් ලෙස සේවය කරයි. බලය විසින් ආශා කිරීමේ සහ ලිංගිකකරණය කරන ලද පුද්ගලයන් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් ශික්ෂණ ක්‍රියාවලියක් ආරම්භ කරයි. **' ආදරය අප සාකච්ඡාවට භාජනය කළ යුත්තේ ඉහත ශික්ෂණ ක්‍රියාවලිය සඳහා වූ මාර්ගයක් ලෙස එය භාවිතා කරන හෙයිනි'** යනුවෙන් ෆුකෝ තම History of Sexuality (1978) කෘතියේ පෙන්වා දෙයි. එසේ නම් ආදරය නැවත අර්ථකතනය කර ගැනීම වෙනුවෙන් වන උත්සාහයක දී එය අද දවසේ හිර වී ඇති හුදකලාවෙන් ගලවා ගත යුතු ය. ආදරය ලිංගිකත්වය තුළ සිර වී ඇති නිමේෂයක අනෙකා දෙස 'ආශා වස්තුවක්' ලෙස බැලීමට අපට ශිෂ්ටාචාරය විසින් ම හුරු කර ඇති අවස්ථාවක 'ආදරය' හරහා අනේකත්වය දෙස බැලීම මෙහිදී ෆුකෝ විසින් අවිශ්වාස කරන්නේ මන්ද යන්න ඔබට දැන් පැහැදිලි ඇතැයි සිතමු. එසේ නම් පරිවර්තනීය මානව සම්බන්ධයක දී අනෙක් අතට ආදරය ප්‍රතික්ෂේප කිරීම යනු අනෙකාට සම්බන්ධ වීමට ඇති සියලු අවකාශ මකා දැමීමක් ද වේ. එසේනම් මෙයට ඇති විකල්පය කුමක්ද? මීට පෙර වාමාංශික පුද්ගලත්ව විසින් අනෙකා ආශා වස්තුවක් ලෙස

හඳුනාගනු ලැබූ බව සහ ඒ ඔස්සේ දේශපාලන-මනුෂ්‍ය සම්බන්ධතා කලාප අවුල් වියවුල් වී ගිය පසුබිමක මේ සඳහා අප කුමක් යෝජනා කරමුද? එයින් අද දිනයේ ආදරවන්තයන්ට ඉගෙන ගත හැකි යමක් තිබේද?

## ආශා කිරීම වෙනුවට ගෞරව කිරීම

අප අනෙකා මුණ ගැසෙන නිමේෂයේ දී ආශා කරනු වෙනුවට ගෞරව කිරීම පමණක් කරන්නේ නම් එවිට 'ආශාව' වෙනුවට 'සදාචාරය' ආදරයේ පදනම ලෙස මිනිසාට හමුවිය හැකිය. ක්‍රිස්තියානියේ මෙන් ම සියලු ආගම්වල පදනම 'සදාචාරය' වන බැවින් අනෙකා මුණ ගැසීම මෙහි දී ආගමික යමක් බවට පත් වේ. ඔබගේ හමුවීම සදාචාරය තුළ සිදුවේ නම් හමුවීම වෙනුවට එතැන ඇතිවන්නේ හමු නොවී හමුවීම වේ. (ආදම් ට ඒව හමු වුණ ද තහනම් ගහේ ගෙඩි කන්නේ නැත. මෙහි අර්ථයයි[2]) එනම් හමුවීම සඳහා පදනම් වන 'දෙයම' (the thing in itself) එම හමුවීමේ ගැටලුව ලෙස තේරුම් ගැනීමයි. එම 'ආශාවම' ආදරය සඳහා ඇති ප්‍රොබ්ලමැතිකය ලෙස තේරුම් ගැනීමයි. බටහිර දී ආදම් විසින් ඒව විනිවිදිනු ලැබුව ද යසුනරි කවබතගේ[3] 'කුඩා ඉශු නලඟන' නිර්මාණයේ (The Dancing Girl of Izu) ටෝකියෝවේ සිට පැමිණි තරුණයා හට ඉශු නළඟණ විනිවිදීමට අවස්ථාව ලැබෙන්නේ නැත. එම මුණ නොගැසීම තුළින් ආත්ම අවබෝධය වෙත යන තරුණයා කඳුළු කැට බේරෙමින් ආපසු ටෝකියෝවට යයි.

> **"ඉශු අර්ධ ද්වීපයේ දකුණු කෙළවර නොපෙනී යන තෙක් ම මම නැවේ වැටට හේත්තු වී ඇත පෙනෙන ඔෂිම දූපත දෙස බලාගත් ගමන් සිටියෙමි...මගේ සිත තුළ හිස්බවක් දැනිණි. කාලය පිළිබඳ හැඟීමක් නොවීය. බෑග් එක මත කඳුළු කඩා හැළෙන්නට විය. මම කඳුළු බිඳු වැහෙන්නට ඉඩ හැර සිටියෙමි. මගේ හිස නිර්මල ජලය බවට හැරී, බින්දු බින්දු වැගී, ඉනික්බිති කිසිවක් ඉතුරු නොවන්නාක් බඳු පහන් සංවේගයක් ඇති විණි."**
>
> (ආරිය රාජකරුණා පරිවර්තනය, පිටුව 52-3).

අයිත්මාතව් ගේ 'ගුරු ගීතය' (1962) නවකතාවෙහි අල්තිනායි ගේ ශරීරය ලිංගිකව විනි නොවිදින දුයිෂෙන් දෙදෙනා වෙන්වන දුම්රිය ස්ථානයේ දී 'අල්තිනායි' යනුවෙන් කෑ ගසයි. තම ආශා ලිබිඩෝව හිස් අවකාශයට හැඟුම් බර වචන ලෙස මුදා හරී; කඳුළු ලෙස දියකර හරී. සුසුම් ලෙස පිටකර හරී[4]. එතැනදී සත්‍ය හමුවීම බවට පත්වන්නේ වෙන්වීමයි. එවන් නො-හමුවීමක් ගැන චිත්‍රණය කරන යසුනරි කවබතා තම 'උදය වළාකුළු' (Morning Clouds) කෙටිකතාව මෙසේ අවසන් කරයි.

> **"ඇය ගමන් කළ දුම්රිය සැඟවී වී ගිය කඳු රේඛාව අසලින් උදය වළාකුළු එල්ලෙමින් තිබුණි. එකී වලාකුළු අතරින් ඇය අත වනමින් සිටින්නාක් මෙන් ද ඇය මා දෙස බලා ගත් ගමන් සිටින්නේ මෙන් ද පෙනිණි. හේමන්ත**

---

[2] *අවශ්‍යනම් කෙනෙකුට මෙසේ ඇසිය හැකිය 'තහනම් ගහේ ගෙඩි නොකා සිටියා නම් මනුෂ්‍ය පැවැත්ම එතැනින්ම අවසන් වීමට තිබුණා නොවේද?' නමුත් ඔබ ඒ කැපකිරීම කළා නම් අනිත් අතට ඔබ උත්කෘෂ්ට වීමටත් ඉඩ තිබුණා නොවේද යන්න අපි පෙරළා අසන ප්‍රශ්නයයි. අවසානයේ දෙවියන් පාවා දීම නිසා ආදම්ට සිදුවුයේ නිකම්ම් නිකම් සාමාන්‍ය මිනිසෙක් වීමට නොවේද ?*

[3] *කවබතගේ සම්පූර්ණ කෙටිකථා එකතුව **Izu no Odoriko (1926)** යටතේ ජපානයේ පළකර ඇති අතර එය කිහිප වරක් ඉංග්‍රීසියට පරිවර්තනය වී ඇත. මෙහිදී භාවිතා වන්නේ මහාචාර්ය ආරිය රාජකරුණා **(1983)** විසින් කරන ලද 'කවබත යසුනරි ගේ කෙටිකථා' නම් පරිවර්තනයයි.*

[4] *ලංකාවේ විශිෂ්ට ගායකයෙන් ලෙස නම් දරා සිටි වික්ටර් රත්නායක මහතා ද මෙසේ කළා නම් (ආශාව සහ තනිකම නොහමුවීම වෙනුවෙන් කැපකළා නම්) ඔහුගේ අද තත්වය කොතරම් වෙනස් ලෙස අපට ප්‍රක්ෂේපනය වීමට ඉඩ තිබුණාදැයි මඳකට සිතන්න. බටහිර ආශා තරණයට ප්‍රතිපක්ෂව ගාන්ධි විසින් සිය බිරිදට කියන්නේ යෙහෙළියක් ලෙස සිටින ලෙසයි **(Gandhi 1982).***

> **සෘතුවේ ආරම්භය හෙයින් උදය කාලය මද සුළඟින් යුක්ත විණි. ඉක්බිති ඇගේ ගමේ ලිපිනයට කොතෙකුත් ලියුම් යැවූ නමුත් ඇගෙන් කිසිදු පිළිතුරක් නොලැබුණි. ඇය මගේ බාලිකා සමයේ සිහිනය මට ඇති තරම් දැක ගැනීමට ඉඩ හැර මගේ අවබෝධය වැඩෙන්නට මඟ පෑදුවා වත් ද? දැන් ඇය ගැන සිහිපත් වන විට මගේ හදවත තුළ වේදනාවක් ඇති නොවේ. එතරම් ම මගේ හදවත සන්සුන් ය. තැන්පත් ය.”**
>
> (ආරිය රාජකරුණා පරිවර්තනය, පිටුව 94)

මෙහි දී ගුරුවරිය සහ ශිෂ්‍යාව ශාරීරිකව දුම්රිය ස්ථානයේ දී වෙන් වුව ද සත්‍යය වශයෙන් වෙන් වන්නේ නැත. මන්ද ගුරුවරිය ලෙස ඇය කර තිබුණේ තම ශිෂ්‍යාවගේ කැඩපත ලෙස (අනෙකා) ක්‍රියාකිරීම පමණි. ඇයගේ ම සිහිනය ඇයට තමා හරහා (තම ශරීරයේ ශෝභාව හරහා) දැක ගැනීමට සැලැස්වීම පමණි. තම ශිෂ්‍යාවගේ ආශා ලිබිඩෝව ස්වයං-අවබෝධයක් දක්වා මානසිකව වර්ධනය වනතුරු, ඇය පරිණත වනතුරු, තමාටත් වඩා ලස්සන ගැහැණියක් බවට පත්වන තුරු, තම ශිෂ්‍යාවගේ කන්‍යාභාවය යනු දෙව්ලියක් වීමට ඇති වරයක් බවට ඇයට අවබෝධ වනතුරු, ඉවසීමෙන් සිටීම පමණි. ඉගැන්වීමට බවට පත් වන්නේ තමාගේ ම ශික්ෂණයයි. ඉවසීමයි. හද පතුලේ ඇති සත්‍ය ආදරය ඇය වෙතට පාර-අනුභූතිකව ප්‍රක්ෂේපණය කිරීමයි. අනෙකා හමුවීම නම් අවස්ථාව ආගමික දෙයක් බවට, දිව්‍යමය දෙයක් බවට, පත් කිරීමයි. හමුවීම තුළ අනෙකාට ගෞරවණීය තැනක් ලබා දීමයි. ආදරය සහ ආගම එකට සම්මිශ්‍රණය කිරීමයි. නො-හමුවීම නම් සාංකාව සඳ මඬල දෙස, වලාකුළු දෙස, ෆුජි කන්ද දෙස, බලාගෙන විමෝචනය කිරිමයි.

වඩාත් හෙගලියානු අර්ථයකින් කිවහොත් කිකුයි ගුරුවරිය කරන්නේ තමා සහ තම ශිෂ්‍යාව (මියකෝ සන්) වෙන් කරන අති මූලික බෙදුම් රේඛාව අහෝසි නොකරගෙන දෙදෙනා මුණ ගැසීමයි.




**රූප සටහන**

අනෙකා හමුවීමට පෙර ම තමා සහ අනෙකා අතර ඇති බෙදුම්කඩනය අහෝසි නොකර ගෙන හමුවීම ඉහත රූප සටහන මගින් ජ්‍යාමාත්‍රයෙන් දක්වයි. ඉහත රේඛාව වනාහි ආගමික දෙයකි.

මෙහි දී සිදුවන්නේ මිනිස් ආශාව වෙනුවට සදාචාර රේඛාව කෙරෙහි අප ගෞරවනාවිත වීමයි. ශිෂ්‍යාවක් ලෙස මිසකො සන් මුල්වරට මුණගැසෙන විට බලපැවැත්වුණු ගුරු-ශිෂ්‍යා රේඛාව ඇය ගමේ පාසැලෙන් ඉවත් වී නගරයට යන දුම්රියට නඟින තුරු ද ඉන් පසුවද (ඇතැම් විට ජීවිත කාලය පුරාවට ද) දිගින් දිගිටම භක්තිමත්ව පවත්වා ගනී. මියකෝ සන් ගෙන් කිකුයි මිස් හට කොතරම් ලිපි ලැබුණ ද ඇය තමා ව දර්පණයක් බවට පත්කර (උත්කෘෂ්ට අත්දැකීමක් බවට පත්කර - පරමාදර්ශයක් දරාගත් ශරීරයක් බවට පත්කර - දෙව් දුවක් (දිව්‍යමය පැවැත්මක්) බවට පත්වීමේ ශක්‍යතාවය රැගත් මනුෂ්‍ය ආත්මයක් බවට පත්කර - තම ශිෂ්‍යයාවට දැකීමට සලස්වයි. තම ශිෂ්‍යාවගේ ආදරණීය ආරාධනාව ඇය පිළිගන්නේ හෝ ප්‍රතික්ෂේප කරන්නේ හෝ නැති මුත් (ඇය ඉච්ඡාභංගත්වයට පත් කරන්නේ හෝ ඇයට වරදකාරී හැඟීමක් දෙන්නේ හෝ

නැත) තමා තුළ ඇය කවුරුන්ද යන්න ඇයට ප්‍රක්ෂේපණය කිරීම නවත් වන්නේ නැත. තම පන්ති කාමරය තුළ ඇයට හිමි තැන ඇය නිරන්තරයෙන් ලබා දෙන අතර ඇයගේ 'දඟකාර කෙළිලොල්' යෞවනයේ නොහික්මුණු ප්‍රේරණය ඇයගේ මවට හෙළිදරව් කරන්නේ ද නැත. එතැනදී ඇය අන් කිසිවකුට වඩා ඇයගේ රහස රැකගත් යෙහෙළියකි. ඇය සහ මියකෝ සන් අතර ඇති 'නිශ්ශබ්ද සන්නිවේදනය'[5] (passive communication) යනු හබමාස්ගේ සන්නිවේදනය සහ සබුද්ධිකරණය (1984) පිළිබඳ න්‍යායට නව මානයක් එකතු කරයි.

> **''මගේ නිවසේ සිට ෆුජි කන්ද අපූරුවට පෙනෙන බව ඇයට දන්වා සිටීමට මට අවශ්‍ය විණි. ඇය මා අසල සිටින සෑම විටකම පාහේ මම එසේ කිරීමට උත්සාහ ගනිමි. එහෙත් කිසිවක් කියාගත නොහැකිව ගොළු වුවක් මෙන් හුන්නෙමි. ඇය මා සමඟ කතාබහ නොකළාය.''**

ආත්ම අවබෝධය සහ පරිණත බව මිනිස් සන්තානය තුළ විකසිත වීම සඳහා කාලයට ඉඩ දෙන කවබතා නිශ්ශබ්ද බව ආත්ම කථනයක් සහ සන්නිවේදනයක් බවට පත් කරයි. එය එකතරා අයුරකින් සද්භාවී ප්‍රවේශයකි.

> ''උණ ගහක් තුළ ඉපදී සඳ ලොවට නැඟී ගිය කුමාරිකාවට ඇය බෙහෙවින් ප්‍රිය කළ බව පෙනී ගියේ ය. සමහර විට ඇය මත්සු ගසට හේත්තු වී සිටි අවස්ථාවෙහි පවා කුමාරිකාව ගැන සිත සිතා සිටින්නට ඇත.''
>
> (පිටුව 94)

ද්‍රව්‍යමය පැවැත්ම සහ දිව්‍යමය පැවැත්ම අතර පාර - අනුභූතික (transcendental) සම්බන්ධයක් ගොඩ නඟන ඇය ඒ දෙක අතර පාලම තනා ගන්නේ ස්වභාවික සෞන්දර්යය හරහා ය. හදිසියේ අඳුරු ස්ථානයක දී මියකෝ මුණ ගැසෙන ඇය (පිටුව 98) දෛනික වාර්තාව බලා මුමුණන්නේ 'හොඳයි' යන්න පමණ ය. පසුව ඇය හැරී යන්නේ අවම වශයෙන් ආපසු හැරී වත් නොබලා ය (පිටුව 99). 'නිශ්ශබ්දව සිටීමෙන් සිදු වුයේ යහපතක්මය' යන්න වහාම මියකෝ ගේ මුවට නැගේ. ඇය සමරු පොතේ තබන එකම කෙටි සටහන වන්නේ සතුට උදාවේවා' යන්න පමණම ය. මිනිස් ආත්මයට කිසිදා උදානොවන මෙම 'සතුට' වනාහී විරුද්ධාභාෂයක් වන අතර ඇයට තම කුඩා ශිෂ්‍යාවන් වෙනුවෙන් දිය හැකි ඉහළ ම ත්‍යාගය වන්නේ ද එම පැවැත්මේ විරුද්භාෂාභාෂය සිහිපත් කර දීම පමණි.

## ආගමේ විෂය සහ ධනවාදයේ විෂය

ඉහත ආත්මීය මුණ ගැසීමට ප්‍රතිපක්ෂව මිනිස් ආශාව කුළුගැන්වීම යනු ධනවාදයේ රජ මාවතයි. ධනවාදයේ පාරිභෝගික භාණ්ඩ විසින් මිනිස් සමාජ ජීවිතය විජිතකරණය කරන බව පවසන ටොඩ් මැක්ගෝවන් තම Capitalism and Desire: The Psychic Cost of Free Markets (2016) හිදී මිනිස් ලෝකය පිරී ඇත්තේ අන්කිසිවකින් නොව පාරිභෝගික භාණ්ඩ විසින් බව සඳහන් කරයි (පිටුව 1). එසේ නම් මිනිසකුට ආශා විෂයක් (subject of desire) බවට පත් නොවී ධනවාදයේ විෂය (subject of Capitalism) බවට පත්විය නොහැකි ය. ආශා නොකරන 'වෙනස්' මිනිසුන් නොයිවසන ධනවාදය (intolerant capitalism) වෙනස් අය තමා තුළට අන්තර්ග්‍රහණය කර පසුව ඔවුන් මුලිනුපුටා (eliminate) දමයි. උදාහරණ ලෙස කොණ්ඩය දිගට වැවූ යෞවනියක් වෙත පැමිණෙන ඇගේ යෙහෙළියන් (අනෙකා) කියන්නේ **'අයියෝ මොනවද තාම ඔය පරණ විදියට, කපන්නකෝ කොන්ඩේ.'** මෙහිදී 'වෙනස' නොයිවසන ඔවුන් ඊළඟට ඇයව

---

*[5] දෙවියන්ගේ සදාකාලික නිශ්ශබ්දතාවය රූපණය කරන මාටින් ස්කෝසේසි ගේ **The Silence (2016)** නම් චිත්‍රපටය තුළ ද ඇත්තේ මෙම තත්ත්වය යි. නිශ්ශබ්දතාව තුළින් දෙවියන් කියන්නේ සියලු මිනිස් ක්‍රියා සඳහා වගවීම ඇත්තේ යේසුස් වහන්සේ විසින් නිදහස් බව ස්ඵුට කරන ලද මිනිසාට බවයි. මිනිසා වැලඳ ගත යුත්තේ එසේනම් ඔහු භුක්ති විදිය යුතු පරම නිදහසයි.*

යවන්නේ නගරයේ සැලූන් එකක් වෙත ය. එතැන දී මුදල් අවශ්‍ය වේ. ඒ සැලූනයෙන් ඇය එළියට එන්නේ තවත් රූපලාවන්‍ය භාණ්ඩ කිහිපයක් මිලදී ගැනීම වෙනුවෙන් රුපියල් පන්දහසක් පමණ වියදම් කර වීන මකරා පච්චයක් ද සමඟ ය. දෘෂ්‍යය සඳහා පවතින ධනවාදය (Spectacle capitalism) යනුවෙන් ගයි ඩෙබෝ මෙය හඳුන්වා දුන්නේ මීට දශක ගණනාවකට ඉහතය. මාගේ ආත්මය සමඟ ධනවාදය පවත්වන මෙම මානසික සම්බන්ධ වනාහී ධනවාදයේ තර්කණයයි (logic of capitalism). දැවැන්ත ගෝලීය පරාසයක වෙනස්කම් දරා සිටිනවා යැයි පම්පෝරි ගසන ධනවාදය සත්‍යය ලෙස ම වෙනස්කම් නොඉවසනවා පමණක් නොව සත්‍යය ලෙස ම සංස්කෘතිය යන්න ම මුලිනුපුටා දමා පාරිභෝගික සංස්කෘතියක් පමණක් අධිනිශ්චය කරයි. එනම් 'ධනවාදී සංස්කෘතිය' යන්න අන් සියලු සංස්කෘති ඉක්මවා විශ්වීයකරණය කිරීම අපට මෙහි දී ගෝලීයකරණය යන්නේත් ව්‍යුත්පන්න කර ගත හැකිය.

වෙනස් විදියකින් කිවහොත් සිදු වන්නේ සියලු මිනිසුන් ධනවාදයේ ආශා විෂයන් බවට විපරිණාමය කිරීම යි. 'සංස්කෘතික විෂමතා අනතර්කරණය' (සියලු ද්‍රව්‍යමය දේ වාෂ්පවීම) යනු සියලු විෂයයන් ආශා විෂයන් බවට පෙරළීමයි. සංස්කෘතිය විසින් මිනිසාට යම් හිමිකමක් - අයිතියක් (belongingness) ලබා දුන්න ද ධනවාදය එවැන්නක් නොකරයි. සංස්කෘතිය විසින් මිනිසාට යම් ස්ථාවර බවක් ලබා දුන්නද ධනවාදය වහාම එය අස්ථාවර චලනයක් බවට පත් කරයි. මිනිසා සිය ස්ථාවර භූමියෙන් උගුල්ලා දමයි. ධනවාදය තුලින් මුල් උගුල්ලා දැමූ මිනිස් විෂය නැවත ජාතිය - සංස්කෘතිය වෙත අනන්‍යවන්නේ මෙම ගැඹුරු මානසික විගලිත භාවය නැත්නම් පරාරෝපණය නිසාය[6].

ධනවාදය ඔබට 'යමක්' ලබා දෙන බවට පොරොන්දු වුව ද (ෆැන්ටසිය) ඊළඟ මොහොතේ එය සුනු විසුනු කර දීමයි. ඔබට ලස්සන විවාහයක් පොරොන්දු වන එය මාස කිහිපයක් එය සුනු විසුනු කර දමයි. නිදහස්ව ජීවත් වීමේ වටිනාකම එය ඔබට එවිට කියාදෙයි. කිසිවකට ඇලී-අයිතිව-හිමිව පැවතීම ධනවාදය නොයිවසයි. එය එහිම තර්කයට මිනිසා අවනත කර ගනියි. 'නිදහස' වන්න 'අයිති නොවී පවතින්න' යනුවෙන් පවසන එය එය විසින් ම ගොඩ නැඟූ ෆැන්ටසිය (විචිත්‍ර රූපය) ඔබගේ දෑස් ඉදිරිපට ම කුඩු පට්ටම් කර දමයි. එසේ නොකර ධනවාදයට පැවතිය නොහැකි ය. කොණ්ඩය දිගට වැවූ යුවතියක් යනු යම් සංස්කෘතියකට හා පීතෘත්ව-සංකේතීය පිළිවෙළකට තමා අයිතිව පවතිනවා යන්නට දෙන සංඥාවක් නම් ධනවාදය එම වෙනස් සංස්කෘතික සංඥාවට එරෙහිව යුද ප්‍රකාශ කරයි (ටොඩ් මැක්ගොවන් ගේ වචනය) ඒ වෙනුවට වෙනස් ෆැන්ටසියක් හඳුන්වා දෙයි. එකෙනෙහිම එම ෆැන්ටසිය ද කුඩු පට්ටම් කර දමයි. ඒ, -අද්‍යතන මනුෂත්වයේ වහල්භාවය තරමයි. මිනිස් විෂයට අනන්‍යතාවක් ස්ථාවරත්වයක්, අයිතියක්, හිමිකමක් දීම ධනවාදයේ අති මූලික තර්කයට පටහැණිය. ධනවාදයේ ආශා විෂය යනු අනන්‍යතාවක් නැති ආත්මයකි. ඔහුගේ එකම අනන්‍යතාව පරිභෝජනය යි. සරලව ම එපමණ ය.

එසේ නම්, ධනවාදයේ ආත්මයට අවශ්‍ය එක්රැස් කර ගැනීමයි (accumulation). වුවමනා හෝ නුවුමනා ඕනෑම දෙයක් ඉහත පාරිභෝගික ආත්මය විසින් ගොඩගසා ගනනු ලබයි. විශ්වවිද්‍යාල ඇදුරෙකුගේ හෝ විධායක මට්ටම පුද්ගලික අංශයක රැකියාවේ නියුතු කෙනෙක්ගේ මෝටර් රථයකට මදක් ගොඩවන්න. ඉදිරිපස කැමරා, පටුපස කැමරා,

*[6] මෙම විගලිතභාවය සමාජ පරිණාමය තුළ අවශ්‍ය ගතිකයක් ලෙස දකින මාක්ස්වාදීන් ලංකාවේ එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික වැඩපිළිවෙලට පක්ෂ වේ. ගැටලුව නම් අතීතය පිළිබඳ ආශා කරන නූතන විෂය පූර්ණ ලෙස ප්‍රග්ධනයේ තර්කයට නම්මවා ගැනීමට ලිබරල් ධනවාදය ශක්තිමත් නොවීමයි. සමජාතීය පාරිභෝගිකයින් වීම (ආශාවට ඇද වැටීම) සහ නොවීම (වෙනස) අතර මෙය පරස්පර තත්වයකි. ජිජැක් (2010) දකින ආකාරයට මෙම විගලිතභාවය (වි-ප්‍රදේශගතකරණය) විසින් මිනිස් විෂය එක් භූගෝල සීමාවකින් විශ්වීය අවකාශයක් වෙත ගෙනයයි.*

වයි ෆයි, ඩොන්ගල්, ඩිජිටල් කැමරා, බැටරි, හැන්ඩ්ස් ෆ්‍රී, හෙඩ්ෆොන්, ලැප්ටොප්, අමතර දුරකථන, සංගීත ධාවන යන්ත්‍ර, බල්, යනාදී පාරිභෝගික භාණ්ඩ තොගයකි. කුමක් තමන් පාවිච්චි කරනවා ද කුමක් ඉවත හළ යුතුද යන්න පාවිච්චි කරන ඔහුවත් නොදනී. සංස්කෘතිය වෙතින් අහිමිකළ අනන්‍යතාවය නැවත ඔහු වෙත ළඟාවන්නේ පාරිභෝගික භාණ්ඩ ලෙසිනි. මැක්ගොවන්ට අනුව ධනවාදයේ විෂය කිසිදිනක 'දැන් මට මේ ඇති' යයි නොකියන අතර එවන් විෂයක අවසානය යනුම ඒකරාශි කිරීමකි. (Capitalism and Desire පිටුව 2) ධනවාදයට කිසිදා මිනිස් විෂයට ලබාදිය නොහැකි තෘප්තියක් ෆැන්ටසියක් ලෙස එය අපිට පොරොන්දු වේ. ධනවාදයට එරෙහි ඕනෑම අරගලයක් එසේ නම් මෙම 'පොරොන්දුව' නම් මානසික අල්ලස වෙත කරන ලිබිඩෝ ආයෝජනයෙන් නිදහස් වුවක් විය යුතුය. මීට පෙර අපි විසින් 'මගේ ලෝකයෙන් පසු ලෝකය' (2017) තුළ දී ගාන්ධි විසින් පරමාදර්ශයක් ලෙස විප්ලවීයකරණය කරන ලද්දේ මෙම මානසික ආයෝජනයෙන් වෙන්වීම බව අවධාරණය කළේ එබැවිණි. එය මෙම නව ධනවාදි යටත්විජිතකරණයෙන් මිදිමේ ප්‍රථම අභිනය යි. එනම් ධනවාදයට එරෙහි අරගලය මුල්ම අවස්ථාවේ දී අනිවාර්යයෙන් ම මානසික විප්ලවයක් යන්න අපි ලාංකික වාමාංශිකයින්ට කියා සිටිමු.

ධනවාදයට ඉදිරියට ගමන් කළ හැක්කේ එකම එක් ආකාරයකට පමණි. එනම් තමන්ගේ යටත්වැසි ආශා විෂයට තම ආශාව මුදුන්පත් කරදීම (තෘප්තිය වැළැක්වීම) 'අසමත්' කිරීම තුළ පමණි. ඔබ අද ගන්නා ස්මාට් දුරකතනයෙන් ඔබ තව වසර ගණනක් 'තෘප්තිමත්' වන්නේ නම් ධනවාදයට ඔබගෙන් වැඩක් නැත. ඔබගේ තෘප්තියේ 'අසමත් ස්ථානය' වනාහී ධනවාදයේ වැඩ බිමයි. ඔබව තෘප්තිමත් කිරීමට එය ඔබට තවත් අලුත් ස්මාට් දුරකතනයක් දෙන මොහොත යනු එහි ජයගහණයයි. එය අපට කරන 'නව යෝජනාව' තුළින් ද අප තෘප්තිමත් නොවේ. ධනවාදයේ 'ද්විත්ව වංචනිකය' (double deception) මෙයයි. ලබා දෙන දෙය මෙන්ම යෝජනාව ද වංචාවකි. නමුත් මේ වංචා දෙකම අපගේ ජාන තුළට ධනවාදය ඇතුළු කර ඇති බව මැක්ගොවන් නිරීක්ෂණය කරයි. එසේ නම් මෙම ආශා කිරීම යනු සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවය ලෙස කරන ධනවාදයේ සූත්‍රගත කිරීම එක් අතකින් අමානුෂික වන අතර අනෙක් අතින් එය දෘෂ්ටිවාදයකි. ධනවාදයට එරෙහි අරගලය දෘෂ්ටිවාදි එකකැයි අපි කියන්නේ මන්දැයි දැන් ඔබට පැහැදිලි ඇතැයි සිතමු. මිනිසා අස්වාභාවික කරන එය එම අස්වාභාවික තත්ත්වය මත ම තම බලය තහවුරු කර ගනී. ස්වභාවධර්මයෙන් මිනිසා සංස්කෘතිය වෙත පොලා පන්නවා වෙනුවට ධනවාදය කරන්නේ අස්වාභාවික මිනිසෙක් නිර්මාණය කිරීමේ අමානුෂික මෙහෙයුම සංස්කෘතික දෙයක් බවට තොරොම්බල් කිරීමයි. උදාහරණ ලෙස තමා ආසන්නයේ ම ඇති ඇපල් ගෙඩිය අහුලා ගෙන අනුභව කර තම කුසගින්න නිවා ගන්නා 'සාමාන්‍ය' මිනිසා වෙනුවට ධනවාදය ඇපල් ගෙඩිය තුළින් ඇපල් ගෙඩිය පාර-අනුභූතිකව සොයමින් ඇපල් ගෙඩියට වඩා වැඩි ඇපල් ගෙඩියක් සොයනා අතෘප්තිමත්-අසහනකාරී-ව්‍යාධි මිනිසෙකු නිර්මාණය කරයි. තමා වරක් ආදරය කළ ගැහැනියට වඩා වැඩි ගැහැනියක් ගැහැනිය තුළින් ම සෙවීමට අපිව උසිගැන්වීමට තරම් ධනවාදය අධම ය. එතරම් ම කෘෘරය. එතරම් ම නග්ගය. වෙනස නම් හැඟවුම හඳුන්වා දෙන ධනවාදය ඇපල් ගෙඩියට වඩා වැඩි හැඟවුමක් වෙත අපව උත්තේජනය කරයි. වෙනස මකා දමයි. නැවත ඇති කරයි. නැවත මකා දමයි. වස්තුව තුළ නැති දෙයක් සෙවීමට බල කරයි. ධනවාදයේ ආශා විෂය මේ අනුව උම්මත්තකයෙකි. දෙවියන් විසින් තහනම් කළ (හැඟවුම) ඇපල් ගෙඩිය නම් ඇපල් ගෙඩියට වඩා වැඩි දෙය නම් අතිමූලික පාපය දක්වා ම අප එය රැගෙන යයි.

සත්ව ලෝකය තුළ ඇපල් ගෙඩියට වඩා වැඩි ඇපල් ගෙඩියක් සාමාන්‍ය සතෙක් නොසොයන බැවින් සත්ව ලෝකය තුළ පමණක් ධනවාදය ක්‍රියාත්මක කළ නොහැකි ය. මන්ද තිරිසන් සතෙකුට ඇපල් ගෙඩියට වඩා වැඩි අතිරික්තයක් ඇපල් ගෙඩිය තුළ නැති හෙයිනි. ඇපල් ගෙඩියක් නොවන ඇපල් ගෙඩියක් සතකුගේ ලොව තුළ නොපවතී. නමුත් අපේ ලෝකය තුළ සබන් කැටයක් වෙනුවට 'දොස්තර අවශ්‍ය නොවන', 'සැමදා සුවෙන් සිටිය හැකි', 'දිව්‍ය අංගනාවක් සේ රුව වඩන' සබන් කැට ඇත. එනම් අපට ඇත්තේ සබන් කැටයක් ලෙස විකෘති කරන ලද සබන් කැටයකි. හැඟවුමක් නැති හැඟවුමකි. ආශා කරන්නා උම්මතකයෙක් කරන ධනවාදය ඒ අතරම ආශා වස්තුව (object of desire) විකෘතියක් බවට පත් කරයි. සබන් කැටයක් නොවන සබන් කැටයක් සොයමින් අප ලෝකය දෙවනත් කරයි. සබන් කැටයම අපේ ආශාවේ බාධාව බවට පත් කරයි. උමතුවේ ව්‍යුහය (මැක්ගෝවන්ගේ වචනය) සඟවාලනු පිණිස කවුරුන් හෝ නිළියක් තවත් සබන් කැටයක් රැගෙන රාත්‍රි පුවත්වලට මොහොතකට පෙර අප ඉදිරියේ රූපවාහිනී තිරය තුළ ප්‍රාදුර්භූත වේ. කිසිවක් නැති වී නැති නමුත් 'නැති වී නැති දෙය' සොයනු පිණිස ක්ෂීරපථ මන්දාකිනිය පසුකර යන ලෙස ඇය අපට උපදෙස් දෙයි. නමුත් ඇය ඇඟ ගල්වන සබන් කැටයම ගනු පිණිස නැවත සුපිරි වෙළෙඳසලට එන ලෙස මන්දාකිනියේ සැරිසරන අපගෙන් ඇය ඉල්ලා සිටින්නී ය.

කවදා හෝ පාරිභෝගික භාණ්ඩයක් විසින් ම අප මේ දුක්ඛිත තත්ත්වයෙන් මුදා ගන්නා බව ධනවාදයේ හැඟවුමයි. එක් අර්ථයක් අනෙකාට ගැටගැසෙන සේම එක් භාණ්ඩයක් අනිකට ගැටගැසෙයි. ක්‍රිකට් සමඟ මොබිටෙල් එකට ගැටගැසෙයි. ක්‍රිකට් තේකුඩු සමඟ ගැටගැසේ. ගැහැනිය ඉඩම් කට්ටි කිරීම සමඟ ගැටගැසේ. සනීපාරක්ෂක තුවා අභ්‍යාවකාශ තරණය සමඟ ගැට ගැසේ. තමාට ආශා කළ නොහැකි නම් අනෙකා අශා කරන දෙය හරහා අප ආශා කරමු. සංගක්කාර අසවල් සබන්වලට ආශා බැවින් අපි ද එම සබන් මිල දී ගනිමු. වෙනස අහෝසි වී ගොස් නව 'සමානත්වයක්' ධනවාදය අප වෙත ගෙන එයි. මිලියන ගණනක් මාසික ආදායම ඇති සංගක්කාර ද රුපියල් 1500/- දවස් කුලියට වැඩ කරන මේසන් බාස් ද යන දෙදෙනාම ලයිෆ්බොයි ගා අත සෝදයි. ඔවුන් දෙදෙනාටම දැන් දොස්තරවරයෙකු අවශ්‍ය නැත.

## වෙනස ආදරයේ පදනම ලෙස

ඉහත 'සමාන බව' ඉදිරියේ අවනිශ්චය වන්නේ පුද්ගල වෙනස යි; සංස්කෘතික වෙනස යි. අනෙකා සමඟ සම්බන්ධ වන දයිලෙක්තික ව්‍යුහය අහෝසි වන විට ම ආදරයේ මූලික පදනම දෙදරා යයි. සියල්ලෝම අසවල් සබන් ගාන, අසවල් විදියට විලාසිතා කරන, අසවල් විදියට විතරක් කන බොන ගෝලීය 'සමානයන්' බවට පත් කරන්නා වූ මෙම ව්‍යාජ අව-මානුෂිකකරණය තුළ 'වෙනස්' පුද්ගලත්ව සලකුණු වීම වෙනුවට සියල්ලෝ ම 'සමාන පාරිභෝගියෝ' බවට පත්වෙති. ආදරය තුළ දී සිදුවන්නේ කුමක් ද? අපි අපිට ම කර ගන්නා ස්වරූපරාගී ආදරය වෙනුවට අපිට සම්මුඛ වන අනෙකා විසින් අප මෙතෙක් ආරක්ෂා කර ගෙන සිටින ලැබූ අනන්‍යතාව (identity) අර්බුදයට යවයි. අපව වි-සමතුලිත කරයි. වෙනත් අයුරකින් කිවහොත් අපගේ ම දර්පණ රූපය (mirror image) අභියෝගයට ලක් කරයි. 'උදය වලාකුළු' කෙටි කතාවේ මියකෝ ගේ ආත්මීය අහංභාවය, ආත්ම අභිමානය - ස්වරූපරාගය- කිකුයි මිස්ගේ අතිශයින් අලංකාර ශරීරය හමුවේ අභියෝගයට ලක් වේ.

> **"මා මගේ රූප සෞන්දර්යය වර්ධනය කර ගැනීමට පිණිස අධික තෘෂ්ණාවකින් පෙළෙන්නට වුයේ ද ඇගේ වරදින්ම ය."**

දයිලෙක්තික ලෙස ගුරුවරියගේ ශෝභාව විසින් ශිෂ්‍යාවගේ සමතුලිත බව අහෝසි කරන අතර එම අහෝසි වීම තුළ ඇය තව තවත් ලස්සන වීමට සහ එම ලස්සන වීම තුළ ම ගුරුවරියකගේ

ආකර්ෂණය දිනා ගැනීමට උත්සාහ කරයි. ඇය පාසලේ මීට කලින් ජපන් භාෂාව ඉගැන්වූ ගුරුවරයාගෙන් 'වෙනස්' වන අතර ඇයගේ ප්‍රවේශය තුළ පළමු ගුරුවරයා තරම් ඇය මුල් කෘතියට ආශක්ත නැත. පයිතයෙන් බණ්ඩනය වන ඇය තම ශිෂ්‍යයාවන්ට ද 'නිදහස්' ලෙස එම පයිතය හැදෑරීමට ධෛර්යමත් කරයි.

> **"බොහෝ දුරස්තව තිබූ කිසියම් ශෝභාවක් හදිසියේ ම අප සමීපයට කිට්ටු වූවාක් බඳු හැඟීමක් ඇති විණි. අපි සිව් දෙනාම ඇගේ ගැටුම ඉතා ඕනෑකමින් නරඹමින් හිඳ මිනිස් සිරුරු සැලෙන විට ඇති වන අලංකාරය පළමුවරට වටහා ගනිමු. ඇය අපේ අතින් අල්ලා ගෙන උගන්වන වීට අපේ සිරුර පුරාම නැටුමේ සෞන්දර්යය ගලා බසින්නාක් මෙන් ලේ දැවෙන අයුරු දැනෙන්නට වන"**
>
> (පිටුව 90).

තමා ගුරුවරිය ලෙසත් ඇය තමාගේ ශිෂ්‍යාව ලෙසත් පැවති අති මූලික රේඛාව කිසිවිටක වෙනස් නොකරන ඇය දියුණුවෙමින් පවතින ගුරු-ගෝල සෞන්දර්ය සම්බන්දය වඩාත් පෝෂණය කරයි.

> ඇය මම දුන් ලේන්සුව මගේ මුහුණෙහි ස්පර්ශ වත් ම මගේ දෙනෙතින් නොනැවතීම කඳුළු කඩා හැලෙන්නට පටන් ගත්තේ ය. මම කඳුළු නොපෙනෙන ලෙස ඇහි බැම අතින් තද කර ගනිමින් කොරිඩෝවට දුව ගොස් පරණ කවුළුවෙන් අහස දෙස බලා සිටියෙමි. ගිම්හාන සෘතුවේ ආරම්භය හෙයින් වලාකුළින් තොර අහස පුරා එළිය වැටී තිබුණි. දීප්තිමත් නව දිවියක ප්‍රීතිය නිමිති කොට ගෙන මගේ මුවට සිනහවක් නැගිණි
>
> (පිටුව 90).

හෙගල් දක්වන ආකාරයට එතැන දී වැදගත් වන්නේ සදාචාරය යි. එනම් ක්‍රිස්තියානි ආදරයේ ව්‍යුහය පදනම් වන්නේ සදාචාරය මත යන්න තේරුම් ගැනීම තුළ ඇයට ආදරය වඩා උත්කෘෂ්ඨ හා සෞන්දර්යාත්මක සම්බන්දයක් බවට පත් කිරීමට අවකාශ ලැබී ඇත. තමාගේ ම වූ 'සදාචාර නීතියක්' ඔස්සේ මිනිසාට කටයුතු කිරීමට ඇති අයිතිය සැබෑ 'නිදහසේ' පදනම ලෙස අර්ථකතනය කරන හෙගල්ගේ (පිටුව 14) ස්ථාවරය සමග සම්බන්ධ කළ හැකි කිකුයිගේ හැසිරීම තුළ ඇය තම ශිෂ්‍යාවට පෙන්වා දෙන්නේ 'මනුෂ්‍ය යුතුකම' (duty) යන්න 'මිනිස් නිදහස' සමඟ සම්බන්ධ කළ යුත්තේ කෙසේ ද යන්න ය.

කැසබලන්කා චිත්‍රපටය (Casablanca, 1942) තුළ දී ද දැකගත හැක්කේ ආදරය සහ වගකීම අතර ඇති පරස්පර සම්බන්ධය යි. රික් එල්සාට ආදරය කළ ද වික්ටර්ගේ බිරිඳ සහ විමුක්ති සටන්කාමියෙක් ලෙස ඇය සමග බැඳුණු විශ්වීය වගකීම වෙනුවෙන් තම හැඟීම්බර අතීතය රික් කැප කරයි. ඇගේ ආපතික පැමිණීම රික්ගේ පැවැත්ම අස්ථාවර කළ ද තමා තමාට ම කරන ආදරය වෙනුවට (ගැහැනිය තමාට ම කර ගැනීම) ඔහු විශ්වීය-බාහිර-අනකේත්වය ගැන සිතයි. තම අනන්‍යතාවය වෙනස්වීම යනු මෙහිදී ආදරයේ මූලික කොන්දේසියකි. කිකුයි මිස්ගේ පැමිණීම විසින් මියකෝගේ සමස්තය ඉඳුරා වෙනස් කරනු ලබන අතර ඇයගේ යෞවන අනන්‍යතාවය සම්පූර්ණයෙන් ම නැවත සකස් වේ. ඇය පරිණත වේ. රික් පවා අත්පත් කර ගත්තේ මිනිස් පැවැත්මේ පරිණත බවයි. එයට අවශ්‍ය වන්නේ කැපකිරීමයි.

## වැලන්ටයින් හඳුනා ගැනීම යනු?

එසේ නම් අපිව 'වෙනස් කරන අනෙකා' (එල්සා- කිකුයි) යනු මිනිසුන් නොවී පාරිභෝගිකයන් වන විට ආදරය පරිණාමය වන්නේ කෙසේ ද? අවම වශයෙන් වැලන්ටයින් රූපකය පවා තවත් එක පාරිභෝගක භාණ්ඩයක් බවට පත්වී නම් එවිට ධනවාදය තුළ ම ආදරය

යනු අතෘප්තිමත් බවේ රූපකයක් නම් අපිට වැලන්ටයින් සාන්තුවරයාගේ අභිනය කෙසේ වැදගත් වේ ද?

දෙවන ක්ලෝඩියස් අධිරාජ්‍යයා විසින් තනි පුද්ගලයන් යුද්ධය සඳහා යෙදවීම වඩාත් ප්‍රතිඵල දායක ලෙස කල්පනා කර (ස්ත්‍රිය විශ්වීය අරමුණු සාධනයේ පුරුෂ බාධාවක් ලෙස තේරුම් ගැනීමේ ඓතිහාසික දේශපාලන අභිනය) තරුණයින්ට විවාහ වීම තහනම් කළ මොහොතේ සාන්ත වැලන්ටයින් විසින් නැවත ඔවුන් වෙත ආදරයේ පණිවිඩය රැගෙන යන ලදී. තවත් වෘත්තාන්තයකට අනුව ඔහු ස්ත්‍රියක් සමග පෙමින් වෙළෙන අතර ඒ වෙනුවෙන් ඔහු මරණ දඬුවම ලබයි. කුමක් නිවැරදි වුවද ඔහු සහ ස්ත්‍රී පුරුෂ ආදරය විෂයෙහි අත්‍යන්ත සම්බන්ධයක් ඇත යන්න සත්‍යයකි. එය දේශපාලනික අර්ථයෙන් වැදගත් ය. නමුත් අද දවසේ එම දිනය වෙන්වන්නේ ධනේශ්වරයේ චොකලට් වෙළෙඳාම වෙනුවෙන් නම්, ලිංගිකත්වය අධිනිශ්චය කිරීම වෙනුවෙන් නම්, ඒ සඳහා ද දේශපාලන සදාචාර මැදිහත් වීමක් අවශ්‍ය කර තිබේ.

මේ සන්දර්භය තුළ 'ආදරයේ දේශපාලනය' ලංකික පොළොවට හඳුන්වා දීම X දේශපාලනය වෙතින් සිදුවූ එක් පුරෝගාමී කාර්යයකි. එය මිය යමින් පැවති පන්ති දේශපාලනය එක්තරා අයුරකින් නැවත වෙනස් ම හැඟවුමක් ඔස්සේ ප්‍රතිව්‍යූහගත කිරීමකි; මියගිය වමට නැවත නව පණක් දීමකි; නව සාමූහිකත්ව හැඟවුමක්[7] වමේ දේශපාලනයට හඳුන්වා දීමකි; අනෙකත්වයේ දාර්ශනික වැදගත්කම මීට දශක දෙකකටත් කලින් අවබෝධ කර ගැනීමකි; ලිංගිකත්වය වෙනුවට ආදරය ඔස්සේ ධනවාදයට සත්‍ය ප්‍රතිරෝධයක් ස්ථාපිත කිරීමකි; ආශාවට එරෙහිව, නව යටත් විජිතකරණීය ධනවාදයට එරෙහිව දැනුවත්ව හෝ නොදැනුවත්ව ඉතාම දියුණු දේශපාලනයක් හඳුන්වා දීමකි. මෙය පසු කාලීනසාමාජිකයන් තේරුම් ගත්තේ නැති වුවද නැවත ප්‍රති-ජීවනය කළ යුතු තත්වයක් සේ හඟිමි.

මැක්ගොවන් ට අනුව මෙම යුගයේ ඇති ඉහළ ම නිදහස යනු දේශපාලන නිදහස නොව ඕනෙම බඩුවක් විකිණීමට ඇති නිර්බාධ අයිතිය යි. ආදරය දේශපාලන අර්ථයෙන් අහිමි වී ඇති බවවත් කිසිවකුට වැටහෙන්නේ නැති මොහොතක අපි ජීවත් වෙමු. අපට ඇති එකම බිය වෙනත් අර්ථ ක්‍රමයක් තුළ මෙතරම් බඩු ගොඩක් අපට අහිමි වේද යන සාංකාව බව ඔහු පෙන්වා දෙයි (බලන්න Capitalism and Desire පිටුව 86). අපි වටේ බඩු ගොඩක් මිස **'අපේ ආත්මය තුළට වෙනස රැගෙන එන'** අනෙකෙක් නොපවතින බැවින් ආදරය යනු අද දවසේ අපෙන් ඉතාම දුරින් තිබෙන දෙයකි. ධනවාදය අපිට කියන්නේ **'මේ ක්‍රමයට අනුගතව ඉන්න. එවිට සියල්ලම ඔබට ලැබෙනු ඇත'** යන්නයි. අනෙක් අතට ආශා කළ යුත්තේ කෙසේදැයි අපිට කියා නොදෙන **'නො-නිදහසක්'** වෙත එය අපිව තල්ලු කර ඇත. අපි විශ්වාස කරන්නේ පාරිභෝගික භාණ්ඩ ගොඩක් කෙරෙහි පමණි. අපි නැවත ගොඩනගා ගත යුත්තේ අනෙකාට ආදරය කිරීමට අවශ්‍ය විශ්වාසය යි. එනම් ආපතික ලෙස ක්‍රිස්තියානි අනේකත්වයේ අවිනිශ්චිත බව වෙත අප නිර්භීතව පය තබමු.

මහේෂ් හපුගොඩ

***[7] උදාහරණ ලෙස මෑතක දී සිදුවූ ඊජිප්තු අරගලය ඇතුළු අරාබි විප්ලවයේ සාමූහික හැඟවුම වූවේ පන්තිය නොවේ . එය බොහෝ පන්ති පදනම් සහ ඒකරාශී වීම්වල වෙනස්ම එකතුවක් විය. මෙය ලංකාවේ යහපාලන අරගලයට වුවද ද අදාළ ය. ඒවා සියල්ල අසාර්ථක වූ බව සත්‍ය නමුදු මිනිසුන් එක්රැස් වන නව ප්‍රපංචයිය (ඇතැම් විට 'ජනප්‍රිය හේතු' මත පදනම් වූ) තත්ත්ව වාමාංශිකයන් ලෙස අපට නොසලකා හැරිය නොහැකිය. එසේම මෙයින් පංති දේශපාලන තත්ත්ව සම්පූර්ණයෙන් අහෝසි වී ඇත යන්න ද ගම්‍ය නොවේ. නමුත් ලැක්ලෝ (1985; 2005) සඳහන් කරන හෙජමොනික තත්ත්වවලින් ගෙන් බැහැරව පවතින නව අනන්‍යයතා පිළිබඳ ව ඉස්මතු වෙමින් පවතින ගැටලුව ද වැදගත් එකකි.***

**ආශ්‍රිත ග්‍රන්ථ:**

Debord. G. (1994). *The Society of the Spectacle*. New York. Zone Books.

Foucault, M. (1978). *History of Sexuality.* (vol. 1). (Trans. Robert Hurley). New York. Pantheon Books.

Habermas. J. (1984). *The Theory of Communicative Action* (Vol.1): Reason and the Rationalization of Society. Boston. Beacon Press.

Laclau, E. & Mouffe, C. (1985). *Hegemony and Socialists Strategy*. London. Verso.

Laclau, E. (2005). *On the Populist Reason.* London. Verso.

McGowan, T. (2016). *Capitalism and Desire: The Psychic Cost of Free Markets.* New York. Columbia University Press.

McGowan, T. & Zeiher, C. (2017). *Can Philosophy Love? : Reflections and Encounters*. London & New York. Rowman & Littlefield.

Zizek, S. (2010). *On Belief: Thinking in Action*. London. Verso.

යසුනරි, කවබත (2013). *කවබත යසුනරි ගේ කෙටිකතා* (පරි. ආරිය රාජකරුණා). නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

අයිත්මාතව්, චිංගීස්. (2013). *ගුරු ගීතය* (පරි. දැදිගම වී රුදිගු). කොළඹ. සූසර ප්‍රකාශකයෝ.

හපුගොඩ, මහේෂ්. & අලවත්ත, ජයසිරි. (2017). *මගේ ලෝකයෙන් පසු ලෝකය.* නුගේගොඩ. සත්හඬ පුවත්පත.

**චිත්‍රපට:**

Attenborough, R. (1982). *Gandhi.* USA. Goldcrest Films/Columbia Pictures.

Scorsese, M. (2016). *Silence.* USA. Paramount Pictures.

Curtiz, M. (1942). *Casablanca.* USA. Warner Brother.